දැන්වීමයි

කොළඹ මහා නගර සභාව

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බඳවා 2 සේවා ගණයේ වැඩ/ක්ෂේත්‍ර/වෙළඳසැල් පරිපාලක III ශ්‍රේණියේ තනතුර සඳහා සිමිත බඳවා ගැනීම - 2026

ගරු බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා විසින් 2014.02.25 දින අනුමත කරන ලද බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බඳවා 2 සේවා ගණයේ වැඩ/ක්ෂේත්‍ර/වෙළඳසැල් පරිපාලක තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව වැඩ/ක්ෂේත්‍ර/වෙළඳසැල් පරිපාලක III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් වෙතින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව කොළඹ මහා නගර සභාවේ ඔබ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු III ශ්‍රේණියේ වැඩ/ක්ෂේත්‍ර/වෙළඳසැල් පරිපාලක තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලත් සේවක මහත්ම/මහත්මින් සඳහා පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ ද සහිතව 2026.07.31 දිනට පෙර නාගරික ලේකම්, නාගරික ලේකම් දෙපාතර්මේන්තුව වෙත එවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

02. වැඩ/ක්ෂේත්‍ර/වෙළඳසැල් පරිපාලක III වන ශ්‍රේණිය තනතුරු සඳහා කොළඹ නගර සභාවේ සක්‍රීය සේවයේ නියුක්ත, තනතුරේ ස්ථීර කර ඇති පහත සඳහන් සුදුසුකම් සහිත ප්‍රාථමික සේවා ගණයක (PL-1,PL2) සේවක /සේවිකාවන් හට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

I. තනතුරු නාමය : බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බඳවා 2 සේවා ගණයේ වැඩ/ක්ෂේත්‍ර/වෙළඳසැල් පරිපාලක - III ශ්‍රේණිය

II. වැටුප් කේත අංකය : MN 1 - 2025 (රා.ප.ච. අංක 10/2025 අනුව)

III. මාසික වැටුප් පරිමාණය :- 45230 – 10 X 540 – 11 X 630 – 10 X 890 – 10 X 1190 – 78360/=

IV. මෙම තනතුර ස්ථීර විශ්‍රාම වැටුප් සහිතය.

V. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට හා ගණිතයට සම්මාන 2 ක් සහිතව විෂයන් 6 කින් සාමාර්ථ ලබා තිබීම. මින් විෂයන් 5 ක් එකවර සමත් විය යුතුය.

VI. පළපුරුද්ද : පළාත් පාලන ආයතනයක PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන සේවය ස්ථීර කර ඇති හා ස්ථීර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කල යුතුය. මෙම කාලය තුල කිසිදු විනය දඩුවමක් ලබා නොතිබිය යුතුය.

VII. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

වෙනත් :
(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට (2026.07.31 දිනට) පූර්වාසන්න වසර තුන (03) ක් බස්නාහිර පළාත තුල අඛණ්ඩ හා ස්ථීර පදිංචිකරුවෙකු විය යුතුය.
(iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

VIII. වයස් සීමාව : අදාළ නොවේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය:-

ලිඛිත විභාගයෙන් ඉහල ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර මෙම පරීක්ෂණ දෙකෙහිම ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

04. ලිඛිත විභාගය :-

විෂය ක්ෂේත්‍රය	කාලය	මුළු ලකුණු	අවම සමත් ලකුණු
<u>සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය</u> මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සමාජයීය. අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් හා අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.	පැය 01	100	40%
<u>ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය</u> <u>වෙළඳ සැල් පරිපාලක</u> පළාත් පාලන ආයතන සතු පොදු වෙළඳපල, පොදු වෙළඳපල සංකීර්ණ සති පොළ, සුපර් මාර්කට්, මස් මාළු අලවිසැල් පාලනය හා අධීක්ෂණය පිළිබඳව මූලික දැනුම පරීක්ෂා කිරීම, කුළී අය කිරීම හා ඒ පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ දැනුම මැන බැලීම. <u>වැඩ/ක්ෂේත්‍ර පරිපාලක</u> පළාත් පාලන අණ පනත් මගින් ඒ ඒ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී කර්මාන්ත අංශයෙන් සිදුකරන කටයුතුවලදී මාර්ග එළි කිරීම, කාණු පද්ධතිය සකස් කිරීම, පෙර මිශ්‍රණ එළීම හා මාර්ග නඩත්තු කටයුතුවල යොදවා සේවකයින්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය හා පාලනය, පැමිණීම හා නිවාඩු ලබා ගැනීමේදී කටයුතු කරන ආකාරය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම.	පැය 01	100	40%

05. සම්මුඛ පරීක්ෂණය :-

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර	උපරිම ලකුණු	තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය
සපුරාලිය යුතු ස්ථීර සේවා කාලයට අමතර සේවා කාලය සඳහා (වසරකට ලකුණු 03 බැගින්)	15	50%
වැඩ බැලීම හෝ රාජකාරී ඉටු කිරීම. (එක් වසරකට ලකුණු 02 බැගින්)	10	
ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම. (එක් එක් ක්ෂේත්‍රයට අදාලව ඉදිරිපත් කරන සරල ගැටළුවක් අනිවාර්ය ප්‍රශ්නයක් ලෙස එක් එක් තනතුරට අදාළ වේ.)	20	
පෞරුෂය	05	

06. තනතුර සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව, වෙළඳසැල් පරිපාලක තනතුරු 03 ක් සඳහා පමණි.
වැඩ/ක්ෂේත්‍ර පරිපාලක තනතුරු 23 ක් සඳහා පමණි.

07. විභාග ගාස්තු :- කොළඹ මහනගර සභාවේ 2025.01.28 දිනැති මූල්‍ය කළමනාකරණ කමිටුවේ තීරණ අංක 1137 පරිදි, කොළඹ මහනගර සභාව විසින් පවත්වනු ලබන විභාග සඳහා ගාස්තු අයකිරීම යටතේ,

(අ) කොළඹ මහනගර සභාවේ සේවයෙහි නියුතු,

- පළමුවර පෙනී සිටින අයදුම්කරුවන් හට විභාග ගාස්තු අය නොකෙරේ.
- දෙවන අවස්ථාවේ සිට
  සම්පූර්ණ විභාගය සඳහා රු. 500.00

මේ අනුව අදාළ මුදල් කොළඹ මහනගර සභාවේ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ පරිපාලන ආදායම් ශීර්ෂ 7112015025 ගිණුමට බැරවන පරිදි කොළඹ මහනගර සභාවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගත් ලදුපත අදාළ ස්ථානයෙහි ඇලවිය යුතුය.

2026.07.31 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අත්හැරීම් හා ප්‍රමාද දෝෂ පිළිබඳ වගකීම ඒ ඒ දෙපාර්තමේන්තුවේ විෂයභාර නිලධාරියා වෙත පැවරේ.

මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද කොළඹ මහනගර සභාවේ නාගරික කොමසාරිස්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

ඒ.ඩී.ඒස්.රෝහණ
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව

ඒ. ඩී. ඒස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ළ.)
කොළඹ මහා නගර සභාව

2026. ජූලි මස ..17.. වන දින
කොළඹ මහා නගර සභාව
නාගරික කොමසාරිස් කාර්යාලයේදිය.